සී/ස එල්ආර්ඩීසී සේවා (පෞද්ගලික) සමාගම - 2023

--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සී/ස එල්ආර්ඩීසී සේවා (පෞද්ගලික) සමාගමේ (‘සමාගම’) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත වලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රමිතියේ 02 වගන්තිය		
	සංකල්ප හා ව්‍යාප්ත මූලධර්ම 2.52 ඡේදය අනුව ප්‍රමිතිය මඟින් නියමකර නොමැතිනම් ආයතනයෙහි ආදායම් හා වියදම් එකිනෙකට හිලව් නොකළ යුතු වුවත් සමාගම සේවාදායක ආයතනය අයකරනු ලැබූ දඩ මුදල් විකුණුම් ආදායමින් අඩුකර පෙන්වා තිබීම හේතුවෙන් විකුණුම් ආදායම රු.මිලියන 33.79 කින් ඌන ගණනය වී තිබුණි.	දඩ මුදල් හා අධිභාරයන් ආයතනය විසින් උපයා නොමැති විකුණුම් වටිනාකම් වන අතර මෙම ද්විත්ව ගැලපීමෙන් පසු ශුද්ධ විකුණුම් වටිනාකම පමණක් ගිණුම් ගත කොට ඇත.	ප්‍රමිතයට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.
(ආ)	**ප්‍රමිතියේ 07 වෙනි කොටස**		
(i)	ප්‍රමිතියේ 7.2 ඡේදයට පටහැනිව සමාගම විසින් රාජ්‍ය බැංකුවක තැන්පත් කර තිබූ මාස 03 ක කාලක් තුළ කල්පිරෙන රු. මිලියන 8 ක් වටිනා ස්ථාවර තැන්පතුවල වටිනාකම ආයෝජන යටතේ ඇතුළත් කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයේ වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි මුදල් සහ මුදල් හා සමාන දෑ එම අගයෙන් ඌන ගණනය වී ආයෝජන එම අගයෙන් අධි ගණනය වී තිබුණි.	මාස 03ක කාල පරාසයක් තුළදී නැවත නැවත එය අලුත් කිරිමට ලක්වන බැවින් එම වත්කම ආයෝජන යටතේ හෙළිදරව් කොට ඇත.	ප්‍රමිතයට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.
(ii)	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදි ඉන් ඉවත් කළ යුතු පොලී ආදායම් රු.මිලියන 16.42 ක් ඉවත් කර නොතිබීම හේතුවෙන් මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය එම වටිනාකමෙන් අධි ගණනය වී තිබූ අතර ආයෝජන කටයුතු වලින් ජනනය වූ මුදල් එම වටිනාකමින් ඌන ගණනය වී තිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරනු ලැබේ.	ප්‍රමිතයට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.
(ඇ)	**ප්‍රමිතියේ 10 වගන්තිය**		
	ප්‍රමිතියේ 10.21 ඡේදයට අනුව ආයතනයක් විසින් හඳුනාගන්නා ලද ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි එහි (අ) සහ (ආ) වගන්ති අනුව නිවැරදි කල යුතු වුවත්, 2018 සහ 2019 වර්ෂයන් වලට අදාළ රු.මිලියන 9.21 ක ජාතිය ගොඩ නැගීමේ බදු සමාලෝචිත වර්ෂයේදි ආදායමක් ලෙස හඳුනා ගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම අගයෙන් අධි ගණනය වී තිබුණි.	NBT පනත අහෝසි වීම මත මෙම මුදල දේශිය ආදායම් දෙපාර්තුමේන්තුව වෙත ප්‍රේෂණය කිරිමේ බැදියාවෙන් නිදහස් විය.ඒ අනුව මෙය වර්තමාන කාල පරිච්ඡේදයේ උද්ගත වූ තත්ත්වයක් මත සිදුවූ නිසා වර්තමාන වර්ෂයට පමණක් බලපාන ගණුදෙනුවක් පමණි.	ප්‍රමිතයට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.

(ඈ) ප්‍රමිතියේ 13 වගන්තිය

ප්‍රමිතියේ 13.19 වන ඡේදයට අනුව සමාගම විසින් රු.77,968 ක් වටිනා ආදේශක තොග (Sample) අයිතම 14 ක්ද රු.මිලියන 6.77 ක් වටිනා Metal Detectors 731 ක් හා රු.මිලියන 2.4 ක් වටිනා CCTV උපකරණ 587 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 9.25 ක් වටිනා තොග වසර 05 ක් පුරාවට නොවිකිණී පැවතුණද එයට අදාළ හානිකරන අලාභය හඳුනාගෙන නොතිබුණි.	නිරීක්ෂණය සමඟ එකඟ වේ.	ප්‍රමිතයට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.

(ඉ) ප්‍රමිතියේ 17 වගන්තිය

(i)	ප්‍රමිතයේ 17.33 ඡේදය අනුව සමාගම විසින් 2021 වර්ෂයේදි සිදු කරන ලද මෝටර් රථ ප්‍රත්‍යාගණනයට අදාළව කිසිදු හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබූ අතර එම ප්‍රත්‍යාගණනය සඳහා ස්වාධීන තක්සේරුකරුවකුගේ සහභාගීත්වයක් ඇති බවද විගණනයට නිරීක්ෂණය නොවීය.	හෙළිදරව් නොකිරිමේ අඩුපාඩුව පිළිගන්නා අතර මෙම තක්සේරුකරණය සිදු කරනු ලැබුවේ තිදෙනෙකුගෙන් යුත් කමිටුවක් මගිනි.	ප්‍රමිතයට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.
(ii)	ප්‍රමිතයෙහි 17.19 ඡේදය අනුව සමාලෝචිත වර්ෂය අවසානයට සමාගමට අයත් රු.මිලියන 12.23 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ තවමත් භාවිතයට ගන්නා ස්ථාවර වත්කම් 229 ක් පැවති නමුත් එම වත්කම් සම්බන්ධයෙන් ඇස්තමේන්තුගත දෝෂය නිවැරදි කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.	ඉදිරියේදී ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරනු ලැබේ.	ප්‍රමිතයට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.

(ඊ) ප්‍රමිතියේ 28 වගන්තිය

ප්‍රමිතයේ 28.18 ඡේදය අනුව නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්වලට අදාළව සමාගම විසින් ගණනය කරන ලද කාලච්ඡේදයට අදාළ සේවක පාරිතෝෂික වියදම රු.මිලියන 37.42 ක් වුවද සමාගම විසින් රු.මිලියන 32.8 පමණක් ආදායම් ප්‍රකාශනයට හඳුනාගෙන තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය රු.මිලියන 4.62 කින් අධි ගණනය වී තිබුණි. එමෙන්ම ප්‍රමිතයේ 28.24 (අ) සහ (ආ) ඡේදය අනුව රු.මිලියන 19.97 ක ආයු ගණක අලාභය අනෙකුත් විස්තීරණ ආදායම යටතේ හඳුනාගෙන නොතිබුණු අතර ප්‍රමිතයේ 28.41 ඡේදය අනුව නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්වලට (Defined Benefit Plan) අදාළව සිදුකළ යුතු හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.	Defined Benefit Plan යටතේ වන නිරීක්ෂණය පිළිගන්නා අතර ඉදිරියේදී මෙම සටහන් කිරිම හෙළිදරව් කිරිම නිසි පරිදි සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.	ප්‍රමිතයට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසාන වන විට සමාගමේ නොසැසඳූ ණයගැති ශේෂය රු. මිලියන 1.28 ක් වූ අතර මෙම ණයගැතියන් නිශ්චිතව හඳුනාගෙන අදාළ ණයගැති ගිණුම් නිවැරදි කිරීමට සමාලෝචිත වර්ෂය අවසන්	නොසැසඳූ ණයගැති ශේෂය රු.මිලියන 1.27ක මුදල 2024 දි හඳුනා ගැනිමට කටයුතු කරනු ඇත.	ණයගැතියන් නිශ්චිතව හඳුනාගෙන ණයගැති ගිණුම් නිවැරදි කලයුතුය.

	වන විටත් කටයුතු කර නොතිබූ අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ණයගැති වටිනාකමින් මෙම වටිනාකම අඩුකර ණයගැති ශේෂය දක්වා තිබුණි.		
(ආ)	2023 දෙසැම්බර් 31 දිනට පැවති රු.මිලියන 45.7 ක ණයගැති ශේෂ සනාථ ලිපි 9 කට අදාළව ගෙවීමට එකඟවී තිබූ වටිනාකම රු.මිලියන 21.3 ක් වුයෙන් ඒ අතර රු.මිලියන 24.4 ක වෙනසක් නිරීක්ෂණය විය. මෙම තත්ත්වයට බලපෑ හේතු විගණනයට පැහැදිලි නොකෙරුණි.	සේවාදායක ආයතන ණයගැති ශේෂ සනාථන ලිපි එව්මේදී අනුගමනය කරනු ලබන්නේ වර්ෂ අවසාන දිනට පවතින ශේෂය නොව ශේෂය සනාථ කරනු ලබන දිනට පවතින ණයගැති ශේෂය වීම වෙනසට හේතුවී ඇත.	ණයගැති ශේෂයන්ගේ වෙනස්කම් සඳහා හේතු සොයාබලා නිරවුල් කළ යුතුවේ.
(ඇ)	සමාගම විසින් මව් සංස්ථාව වෙතින් ලද CCTV කොන්ත්‍රාත්තුවකට අදාළව සංස්ථාව වෙතින් නොලැබෙන රු.මිලියන 1.59 ක් විකුණුම්වලින් අඩුකර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් විකුණුම් ආදායම් එම අගයෙන් ඌන ගණනය වී තිබුණි.	නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. මෙය නිවැරදි කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.	විකුණුම් ආදායම නිවරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය.
(ඈ)	සමාගම විසින් එහි මව් සමාගම වන ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම වෙත සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 2.48 ක් වටිනා ආරක්ෂක සේවාවන්ද රු.මිලියන 4.88 ක් වටිනා මිනිස් බල සේවාවන්ද එහි ප්‍රධාන මව් සමාගම (Ultimate parent) වන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 89.15 ක් වටිනා ආරක්ෂක සේවාවන්ද රු.මිලියන 426.11 ක් වටිනා මිනිස් බල සේවාවක්ද ලබාදී තිබූ අතර එම සේවාවන් සැපයීමේදී අන්තර් සමාගම් අතර මිල තීරණය කරන පදනම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	එම හෙළිදරව් කිරිම් 2024 මූල්‍ය වාර්තා වල සිදු කරනු ඇත**.**	අදාල හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය.
(ඉ)	සමාගම විසින් ලබාදුන් මූල්‍ය ප්‍රකාශන හා ගිණුම්කරණ මෘදුකාංගය වෙතින් ලබාගත් මූල්‍ය ප්‍රකාශන අතර විකුණුම් පිරිවැය රු. මිලියන 50.43 ක, පරිපාලන හා අනෙකුත් වියදම් රු. මිලියන 67.66 ක හා මූල්‍ය වියදම් රු.මිලියන 1.84 ක වෙනස්කම් නිරීක්ෂණය විය.	මූල්‍ය වාර්තා වල ආකෘතිමය වෙනසක් සිදු වන විට එය ඒ ආකාරයෙන්ම QB Package තුළ සිදු කර නොහැකි වන නිසා මෙම තත්ත්වය උද්ගත වි ඇත.	වෙනසට හේතු සොයා බලා නිවරදි කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසානයට සමාගමේ වෙළඳ ණයගැති ශේෂය රු.මිලියන 1,557.36 ක් වූ අතර ඉන් රු. මිලියන 62.89 ක් වර්ෂ 1ත් 2ත් අතර පැවැති අතර වර්ෂ 2 ත් 5 ත් අතර කාලයක සිට අයවිය යුතුව පැවති වටිනාකම රු.මිලියන 110.18 ක් විය. එමෙන්ම වර්ෂ 5 ට වැඩි කාලයක සිට අයවිය යුතුව පැවති වටිනාකම රු.මිලියන 25.33 ක් විය. මෙම ණය ගැති ශේෂයන්ගෙන් රු.මිලියන 1,251.6 ක් ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් වූ අතර එම ශේෂයන් ගෙන් සියයට 53 කට අධික ප්‍රමාණයක් එනම් රු. මිලියන 669.63 ක් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ශේෂ වූ අතර සියයට 14 ක් එනම් රු. මිලියන 171.78 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් අයවිය යුතු ශේෂ විය. මෙම ණය ගැති ශේෂයන්ගෙන් රු.මිලියන 302.54 ක් මිනිස් බල සැපයීම වෙනුවෙන් ආයතන 04 කින් අයකර ගත යුතුව පැවතුණි.	මෙම නිරීක්ෂණ හා එකඟ වේ. වර්තමානයේ ණය එකතු කිරීමේ ක්‍රියාවලිය කෙරෙහි දැඩි අවධානයක් යොමු කොට එය මනා ලෙස කළමණාකරණය කිරීම හේතුවෙන් මෙම ණයගැති ශේෂය රු.මිලියන 1557 සිට රු.මිලියන 1150 දක්වා අඩු වී ඇත.	ණයගැති ශේෂ කඩිනමින් අයකරගැනීමට කටයුතු කළයුතු වේ.
(ආ)	සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආරක්ෂක සේවාවන් හා මිනිස් බල සේවාවන් සැපයීම වෙනුවෙන් පිළිවෙලින් මව් සමාගම වන ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගමෙන් රු. මිලියන 17.86 ක් හා රු. මිලියන 25.13 ක් සහ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවෙන් (Ultimate parent) රු. මිලියන 41.05 ක් හා රු.මිලියන 82.94 ක් ලැබිය යුතු ශේෂයන් පැවතුණි. ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගමෙන් මිනිස් බල සේවා සැපයීම වෙනුවෙන් රු. මිලියන 15.44 ක් වසර 4 ක කාලයක සිට ලැබිය යුතුය පැවතුණු අතර ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙතින් ඉකුත් වර්ෂයන්හි සපයන ලද තාක්ෂණික සේවාවන් (Technological Solution), අනෙකුත් ලැබීම් හා දරන ලද වියදම් වෙනුවෙන් රු.මිලියන 20.5 ක් සමාගම වෙත ලැබිය යුතුව පැවතුණි.	අයවිය යුතු හිඟ මුදල් සම්බන්ධයෙන් දක්වා ඇති විශ්ලේෂණ හා එකඟ වේ. REDECO ආයතනය මූල්‍ය තත්වය යහපත් වූ පසු මෙම ණය මුදල් අය කර ගැනිමේ හැකියාව පවතින බව දැනුම් දෙමි.	හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළයුතුය.

1.6.2 ගෙවිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාගමේ සේවය හැරගිය නිලධාරීන්ට අදාළව සමාලෝචිත වර්ෂය අවසාන වන විට ගෙවිය යුතු වැටුප් ලෙස රු.මිලියන 49.76 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර ඉන් සමාලෝචිත වර්ෂයට අදාළ රු.මිලියන 17.72 ක් වූ අතර ඉතිරි රු.මිලියන 32.04 වර්ෂ 1 ත් 5 ත් අතර කාලයක සිට පැවතුණි.	නොගෙවූ වැටුප් රු.මිලියන 49.75ක් පමණ ඇති අතර ඉන් වර්ෂ 05 ට වැඩි සියලු නොගෙවූ වැටුප් අනෙකුත් ආදායම් ලෙස සැලකේ.	ගෙවිය යුතු වැටුප් කාලීනව නිරවුල් කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2007 අංක 07 දරන සමාගම් පනත			
	166 වන වගන්තිය	සෑම සමාගමකම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශේෂ පත්‍ර දිනට පසුව මාස 06 ක් ඇතුළත එදිනෙන් අවසන් වන ගිණුම් කාලපරිච්ඡේදය තුළ සමාගමේ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාවක් පිළියෙල කරනු ලැබිය යුතු වුවත් සමාගම එලෙස කටයුතු කර නොතිබුණි.	වාර්ෂික වාර්තා නියමිත පරිදි පිළියෙළ කිරිමේ කටයුතු ඉදිරියේදි සිදු කිරිමට අදාළ නිලධාරින්ට උපදෙස් ලබා දී ඇත.	සමාගම් පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.
(ආ)	2018 අංක 19 දරණ ජාතික විගණන පනත 15 වන ඡේදය	විගණනය කරන ලද රජයේ මුල්‍ය ප්‍රකාශන සහ ඒ සම්බන්ධ විගණකාධිපතිවරයාගේ මතයද සහිතව වාර්ෂික වාර්තාව, පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් සමාගම විසින් 2018 වර්ෂයේ සිට විගණිත මුල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් කරුණු සොයා බලා ඉදිරියේදි නිවැරදි කිරිමේ ක්‍රියාවලියක් ගනු ඇත.	විගණන පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.
(ඇ)	2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021			
(i)	අත්පොතෙහි 2.3 ඡේදය	ආරක්ෂිත සේවාවන් සැපයීම, තාක්ෂණික විසඳුම්, ආරක්ෂිත විමර්ශන, මිනිස් බල සේවා සහ අනෙකුත් විමර්ශන සේවා සැපයීම සමාගමේ ප්‍රධාන කාර්යයන් වන අතර ඒවා ලබා කර ගැනීමට අපේක්ෂිත භෞතික හා මූල්‍ය ඉලක්කයන් දැක්වෙන ක්‍රියාකාරී සැලැස්මක් සමාගම පිළියෙල කර නොතිබුණි. එසේම, සමාගමේ ප්‍රමුඛ කාර්යයන් වෙනුවෙන් ප්‍රධාන කාර්යසාධන දර්ශක කළමනාකරණය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර නොතිබුණි. මේ හේතුවෙන් සමාගමේ සමාලෝචිත වර්ෂයේ කාර්යසාධනය ඇගයීමට විගණනයේදී නොහැකි විය.	නිරීක්ෂණය හා එකඟ වේ. 2024 වර්ෂයේදී මේ වන විට අවු.04ක් සඳහා පිළියෙළ කරනු ලැබු ක්‍රියාකාරි සැලැස්ම පිළියෙළ කර ඒ සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය අනුමැතියද ලබා ගෙන ඇත.	චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

(ii)	මාර්ගෝපදේශ සංග්‍රහය 3.5 ඡේදය	රාජ්‍ය ව්‍යාපාරවල නිලධාරීන් අමාත්‍යාංශයේ හෝ වෙනත් රාජ්‍ය ආයතන වල සේවය සඳහා මුදානොහැරිය යුතු බව නියමකර තිබියදී සමාගමේ සේවකයින් 3 දෙනෙකු වෙනත් රාජ්‍ය ආයතන වෙත නිදහස් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී වැටුප් ලෙස සේවකයන්ට ගෙවූ රු.මිලියන 2.02 ක මුදලක් ප්‍රතිපූරණය කර ගැනිමට කටයුතු කර නොතිබුණි.	2023 වසරේදී සමාගමේ සේවකයින් තිදෙනෙකු (03) සංස්ථාව හි සේවා කටයුතු සඳහා මුදාහැර ඇති බව පිළිගත් අතර ඔවුන්ගේ සියලු ගෙවීම් වලට අදාළව හර පත් (Debit Note) පිළියෙළ කොට භාරදී ඇත.	මාර්ගෝපදේශ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතුය.
(ඇ)	2019 නොවැම්බර් 20 දිනැති දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/P/2/25 (i) දරන චක්‍රලේඛය සහ 2022 අප්‍රේල් 08 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 04/2022 හි 2.7 වන ඡේදය	රජය සතු ව්‍යවසායන් මගින් නැවත දැනුම් දෙනතුරු සියළුම සමාජ සත්කාර ක්‍රියාකාරකම් අත්හිටවිය යුතු බවත් එසේ යම්කිසි සමාජ සත්කාර ක්‍රියාකාරකමක් සිදුකර ගෙන යන්නේ නම් ඒ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා, කළමණාකරන මණ්ඩලයේ සාමාජිකයින් සහ ප්‍රධාන විධායක නිලධාරී පුද්ගලිකවම මේ සම්බන්ධයෙන් වගකිව යුතු බවටත් උපදෙස් ලබා දී තිබුණද ඊට පටහැනිව සමාගම විසින් රු.මිලියන 5.05 ක් සමාජ සත්කාර ක්‍රියාකාරකමක් සඳහා වැය කර තිබුණි.	දියත්සර නෙත්රු සමාජ සත්කාරමය ව්‍යාපෘතිය වසර කිහිපයක් තිස්සේ කොරෝනා වැනි හේතුන්ට සාමාන්‍ය ජනයා මුහුණ දුන් අපහසුතා හා දුක්කම්කටොලු වලින් මුදවීමේ සමාජීය වැඩසටහන් ලෙස සිදුකරන ලදී. මෙම ව්‍යාපෘතිය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය යටතේ සිදු කරන ලදී.	චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළයුතුවේ.

1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2019 වර්ෂයට අදාලව මුදල් පදනම මත එකතු කළ අගය මත බදු වටිනාකම රු. මිලියන 110.91 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට තවදුරටත් ගෙවිය යුතුව පැවතුණි. සමාගමේ කාරක ප්‍රාග්ධනය වෙනුවෙන් එම බදු මුදල් යොදාගෙන තිබුණු බව නිරීක්ෂණය විය.	2023 දෙසැම්බර් 31 දිනට හිඟව පැවති මුදල් පදනම මත ගෙවිය යුතු VAT බදු මුදල රු.මිලියන 110.91කි.	ගෙවිය යුතු වැට් බදු එළඹෙන මාසයේ 20 වන දින හෝ එදිනට පෙර දේශිය අදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතුය.

2 මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයට අදාළව මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 123.98 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු. මිලියන 81.48 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 42.5 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ප්‍රධාන ආදායම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 759 කින් එනම් සියයට 26 කින් සහ අනිකුත් ආදායම රු.මිලියන 9.15 කින් එනම් සියයට 31 කින් ඉහළ යාම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සේවා පිරිවැය රු.මිලියන 702.87 කින් එනම් සියයට 27 කින් හා ආයතන සහ අනිකුත් වියදම් රු. මිලියන 23.24 කින් එනම් සියයට 13 කින් ඉහළ ගොස් ඇතත් ආදායම වැඩිවීමේ ප්‍රතිශතයට සාපේක්ෂව වියදම වැඩිවීමේ ප්‍රතිශතය අඩු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාළව ආයතනයේ මූල්‍ය ප්‍රතිඵල ඇගයීමේදි පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

විස්තරය	2023 රු.මිලියන	2022 රු.මිලියන
ආදායම	3,638.35	2,879.23
අනෙකුත් ආදායම	38.25	29.09
ආයතන හා පරිපාලන වියදම්	206.60	183.36
මූල්‍ය පිරිවැය	4.94	5.27

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාගමේ ආදායම සියයට 26.37 කින් වර්ධනය වී තිබූ අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදි ආරක්ෂක සේවා ආදායම සියයට 12.25 කින් මෙන්ම මිනිස් බල ආදායම් සියයට 86.12 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) ආයතන හා පරිපාලන හා වෙනත් වියදම් සියයට 12.68 කින් වර්ධනය වී තිබූ අතර ඒ සඳහා සමාගමේ මෝටර් රථ අළුත්වැඩියා සහ නඩත්තු වියදම් වල සියයට 126.16 කින් වැඩිවීම හේතු වී තිබුණි. ප්‍රචාරණ වියදම්ද ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 124.46 කින් වැඩි වී තිබුණි.

2.3 අනුපාත විශ්ලේෂණය

ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වූ සමාගමේ ඇතැම් වැදගත් අනුපාත ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

	2023	2022
දළ ලාභ ආන්තිකය (ප්‍රතිශතය)	8.1%	8.37%
ශුද්ධ ලාභ ආන්තිකය (ප්‍රතිශතය)	2.41%	2.15%
ජංගම අනුපාතය (වාර ගණන)	1.49:1	1:54.1
ණයගැති පිරිවැටුම් අනුපාතය (වාර ගණන)	2.57	2.67
ණය එකතු කිරීමේ කාලය (දින ගණන)	142	136

(අ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදි සමාගමේ දළ ලාභ අනුපාතය සියයට 0.27 කින් අඩු වී තිබූ අතර මේ සඳහා සමාගමේ අයභාරය සියයට 26.37 කින් හෙවත් රු.මිලියන 759.13 කින් වැඩිවන විට විකුණුම් පිරිවැය සියයට 26.64 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) සම්මතයක් ලෙස 2:1 අනුපාතයට තිබිය යුතු ජංගම අනුපාතය 1.54:1 සිට 1.49:1 දක්වා ඉකුත් වර්ෂයට අනුරූපීව තවදුරටත් පිරිහී තිබුණි. ඒ සඳහා වෙළඳ ණය හිමි හා අනෙකුත් ගෙවිය යුතු ශේෂයන් සියයට 33.61 ක වැඩි වීම හේතුවී තිබුණි.

2. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාගම සිය ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අත්තිඩියේ පිහිටි පර්චස් 120 ක ඉඩමක් ප්‍රධාන මව් සමාගමෙන් වර්ෂ 30 කට දිගු කාලීන බදු පදනම මත රු. මිලියන 19.91 කට 2018 වර්ෂයේදී ලබා ගෙන තිබූ අතර 2024 ජූනි වන විට බදු කාලයෙන් වසර 06 ක් ගතවී තිබුනද කිසිදු ඉදිකිරීමක් සිදුකර නොතිබුණි. එම ඉඩම වටා රු. මිලියන 5.87 ක පිරිවැයක් දරා අඩි 700 ක් පමණ දිගකින් යුත් තාප්පයක් 2019 වර්ෂයේදී ඉදිකර තිබූ අතර මව් සමාගමට අයත් කොටසක්ද ඇතුළත් කරමින් එම තාප්පය සමාගම විසින් ඉදිකර තිබුණු අතර ඊට අමතරව එම ඉඩමේ ආරක්ෂාව, විදුලිය හා ජලය සඳහා 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. මිලියන 2.72 ක් වැය කර තිබුණි. ඉඩම මැදින් 33KVA අධි බලැති විදුලි රැහැන් ඇද ඇති බැවින් ඉදි කිරීම් සඳහා මෙම ඉඩම තෝරා ගැනීම විගණනයේදී ප්‍රශ්නකාරී විය. එමෙන්ම අනාගතයේදී මෙම ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදම් අනාර්ථික වියදමක් විය හැකි බවද වැඩි දුරටත් නිරීක්ෂණය විය.	නිරීක්ෂණ හා එකඟ වේ.මෙම ඉඩම නැවත SLLDC වෙත පවරා දීමට නියමිත අතර ඒ මත ආයතනය වෙත ආපසු ගෙවන ලබන මූල්‍යමය අගය සම්බන්ධයෙන් මේ වනවිට මව් සමාගම සමඟ සාකච්ඡා කර තීරණයක් ගනු ලැබේ.	අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.
(ආ)	සමාලෝචිත වර්ෂය අවසානයට ණයගැති ශේෂය තුළ පැවති රු. මිලියන 13.40 ක් සඳහා සියයට 100 ක් අඩමාන ණය වෙන් කිරීමක් සමාගම සිදුකර තිබුණි. මින් රු.මිලියන 1.43ක අඩමාන ණය වෙන් කිරීමට හේතු වී ඇත්තේ එම ණය ගැති බිල්පත්වලට අදාළ මුලාශ්‍ර ලේඛණ සමාගම සතුව නොමැති වීමයි.	සියයට සියයක් අඩමාණ ණය වෙන්කොට ඇත්තේ ශේෂයන් පැරණි නිසා හා ඒ මත මෙම ණය මුදල් අය කර ගැනිමේ ශක්‍යතාවය ඉතා අඩු මට්ටමක පවතින නිසාය.	ණයගැති ශේෂවලට අදාළ මූලාශ්‍ර ලේඛන ආරක්ෂිතව පවත්වාගෙන යා යුතුය.
(ඇ)	සමාගමේ ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්ති අංක 2.4.1 අනුව විශ්වාසවන්තව මිනුම් කළ හැකි තහවුරු කර ගත් සාක්ෂි මත ඉන්වොයිසි පිළියෙල නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ සේවාලාභී ආයතන ගෙවීම් ප්‍රතික්ෂේප කිරීමෙන් ඉන්වොයිස් කරන ලද රු. මිලියන 59.07 ක ආදායමක් අහිමි වී තිබුණි. මෙම තත්ත්වය අවම කර ගැනීම සඳහා කටයුතු කරන බව ඉකුත් වර්ෂයේදි සමාගම විසින් විගණනයට පිළිතුරු ලබාදී තිබූ නමුත් එසේ කටයුතු කර නොතිබුණි.	පාලනමය ක්‍රියාමාර්ග ශක්තිමත් කිරිම තුළින් ඉදිරියේදී මෙම තත්ත්වය සතුටුදායක මට්ටමකට පත් කීරිමට සියලු උත්සාහයන් ගනු ඇත.	විශ්වාසවන්තව මිනුම් කළ හැකි තහවුරු කර ගත් සාක්ෂි මත ඉන්වොයිසි පිළියෙල කළ යුතුය.
(ඈ)	අලෙවිය සඳහා සමාගම විසින් 2018 වර්ෂයේදි ඩොලර් 49,537.90 කට (රු.මිලියන 8.73) මිලදීගෙන තිබූ CCTV උපකරණ 1,669 කින් සමාලෝචිත වර්ෂය තුළ උපකරණ 248 ක් පමණක් අලෙවි කර	මිලදී ගැනීමට අදාළව අනුගමනය කර තිබූ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පැවති දූර්වලතා සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය විසින් පරීක්ෂණයක් සිදු	වෙළඳපල අවශ්‍යතාවය හඳුනාගැනීමෙන් අනතුරුව

	තිබූ අතර රු.මිලියන 2.4 ක් වටිනා ඒකක 587 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉතිරිව පැවතුණි. මේ හේතුවෙන් සමාගමෙහි මුදල් අනවශ්‍ය ලෙස තොගයෙහි ඇතුළත්ව පැවතුණි. භාණ්ඩ අලෙවි කිරීමට නොහැකි වීම හේතුවෙන් හා ඒවා තාක්ෂණික යල්පැනීම හේතුවෙන් 2021 වර්ෂයේදි රු. මිලියන 3.19 ක තොග කපා හැරීමක්ද සිදුකර තිබූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල නොවන මිලදී ගැනීම් සිදුකළ නිලධාරීන්ට එරෙහිව නිත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට සමාගම අපොහොසත් වී තිබුණි.	කර වාර්තා කර තිබේ. එම වාර්තාව පදනම් කරගෙන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කිරීමට කටයුතු කරන ලදී.	ප්‍රසම්පාදනය කිරීම සිදුකළ යුතු අතර මෙම මිලදී ගැනීම සිදුකළ පාර්ශවයන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතුය.
(ඉ)	වෙළඳපලෙහි අවශ්‍යතාවය පිළිබඳව නිවැරදිව පුරෝකථනය නොකොට 2018 වර්ෂයේදි රු.මිලියන 2.34 කට ආනයනය කර තිබූ Hand Held Metal Detectors with Chargers ඒකක 1000 කින් ඒකක 506 ක් හා රු. මිලියන 10.77 ක් වැය කොට ආනයනය කරන ලද අයිතම 8 කට අදාළ ඒකක 731 ක ආරක්ෂක උපකරණ සමාලෝචිත වර්ෂයේදිද අලෙවි කිරීමට නොහැකිව පැවතුණි. මෙම උපකරණවල වගකීම් කාලය මේ වන විට ඉකුත් වී තිබූ අතර අලෙවියෙන් පසු සේවා සඳහා දේශිය නියෝජිතයෙකු පත්කර ද නොතිබුණි. භාණ්ඩ අලෙවි කිරීමට නොහැකි වීම හේතුවෙන් හා තාක්ෂණික යල් පැනීම් හේතුවෙන් 2021 වර්ෂයේදි එම උපකරණවලින් රු. මිලියන 5.18 ක තොග කපාහැරීමක් සිදු කර තිබුණි. තවද මෙම ගණුදෙනුව සම්බන්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණයක්ද 2021 වර්ෂයේ සිට සිදුවෙමින් පවතින නමුත් සමාගම විසින් මේ දක්වා එම ගණුදෙනු සම්බන්ධ කිසිදු පරීක්ෂණයක් සිදු කර නොතිබුණි.	මිලදී ගැනීමට අදාළව අනුගමනය කර තිබූ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පැවති දුර්වලතා සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය විසින් පරීක්ෂණයක් සිදු කර වාර්තා කර තිබේ. එම වාර්තාව පදනම් කරගෙන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කිරීමට කටයුතු කරන ලදී.	වෙළඳපල අවශ්‍යතාවය හඳුනාගැනීමෙන් අනතුරුව ප්‍රසම්පාදනය කිරීම සිදුකළ යුතු අතර මෙම මිලදී ගැනීම සිදුකළ පාර්ශවයන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
වෙළඳපල අවශ්‍යතාවය නිවැරදිව ඇගයීමකින් තොරව සමාගම විසින් ක්‍රියාත්මක කරන ලද බෝට්ටු සේවය සඳහා සමාලෝචිත වර්ෂයේ ආදායම රු. මිලියන 7.81 ක් වුවද බෝට්ටු සේවය පවත්වාගෙන යාම සඳහා වර්ෂය තුළ දරන ලද තත්‍ය පිරිවැය රු. මිලියන 14.23 වුයෙන් රු. මිලියන 6.42 ක අලාභයක් සමාගමට දැරීමට සිදුව තිබුණි. නිසි ආදායම් වියදම් කළමනාකරණයක් නොමැතිවීම මෙම තත්ත්වයට ඍජුව බලපා තිබුණි.	බෝට්ටු සේවයේ මුල්‍යමය අලාභය ඉදිරියේදි අවම කිරීම සඳහා ආයතනය විනෝද බෝට්ටු සවාරි සඳහා අය කරනු ලබන මිල ගණන් සංශෝධනය කිරීම හා සේවා කාර්යය අඩු කිරීම සිදුකරනු ලැබේ.	වෙළඳපළ අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනාගැනීම සහ පිරිවැය අවම වන අයුරින් ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු සිදු කිරීමට අවධානය යොමු කළයුතු වේ.

3.3 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය තුළ ආරක්ෂක සේවය සහ අනෙකුත් සේවා සඳහා නිලධාරින් 3672 ක් බඳවා ගෙන තිබුණු අතර සේවයේ යෙදී සිටි නිලධාරීන් 3156 දෙනෙකු සේවයෙන් ඉල්ලා අස්වී හෝ නොදන්වා සේවය අතහැර ගොස් තිබුණි. මෙම සේවක පිරිවැටුම අවම කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් සමාගම විසින් සිදුකර නොතිබුණි.	ආරක්ෂක සේවයේ පවතින ඉතා අඩු වැටුප් නිසා සේවකයන් රඳවා තබා ගැනීම ඉතා අපහසු කාර්යයකි. සේවක පිරිවැටුම අඩු කිරීම සඳහා වන එකම අභිප්‍රේරණය වැටුප් වැඩි කිරීම වන අතර මේ වන විට ඒ සඳහා ප්‍රධාන සේවා ලාභී ආයතන වෙතින් ඉල්ලීම් කර ඇත.	සේවක පිරිවැටුම අවම කිරීම සඳහා උපායමාර්ග හඳුනාගත යුතුය.